NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

**11 ශ්‍රේණිය** | **පෙරදිග සංගීතය** | **2 ඒකකය**

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර

01. විභාග හතරකින් යුතු තාලයක නිවැරදි තාල සංකේත විය යුත්තේ,

(i). X 2 3 0 (ii). 2 3 0 X (iii). X 2 0 3 (iv). X 0 2 3

02. | ති ති නා | ති ට ති ට | ති ති නා | තු නා තු නා |

ඉහත තබ්ලා අක්ෂර සියල්ල නිකුත් කළ හැක්කේ,

(i). දායාවෙන් පමණි

(ii). බායාවෙන් පමණි

(iii). දායාවෙන් හා බායාවෙනි

(iv). දායාවෙන් හා බායාවෙන් වෙන් වෙන්ව වැයීමෙනි

03. ඉහත අක්ෂර ප්‍රස්ථාර ගත කර ඇත්තේ,

(i). ජප් තාලයට අනුව

(ii). දීප් චන්දි තාලයට අනුව

(iii). ත්‍රිතාලයට අනුව

(iv). බෙම්ටො තාලයට අනුව

04. තාලයක පළමු මාත්‍රාවේ සිට අවසාන මාත්‍රාව දක්වා මාත්‍රා පරාසය හඳුන්වනු ලබන්නේ,

(i). යේකාව නමිනි (ii). විරිත නමිනි (iii). ආවර්ථ නමිනි (iv). මාත්‍රා නමිනි

05. මාත්‍රා 14 කින් යුතු තාලය හඳුන්වන්නේ,

(i). ජප් තාලය

(ii). දීප් චන්දි තාලය

(iii). දාදරා තාලය

(iv). බෙම්ටො තාලය නමිනි

06. එම තාලයට සමාන දේශීය තිත වනුයේ,

(i). සුළු තනිතිත

(ii). මැදුම් තනිතිත

(iii). සුළු මැදුම් දෙතිත

(iv). මැදුම් මහ දෙතිත

07. ''සතර සිව්වර බලැති දිඩකර'' මෙම ගී පාදයට ගැළපෙන තාලය වනුයේ,

(i). ජප් තාලයයි

(ii). දීප් චන්දි තාලයයි

(iii). ලාවනි තාලයයි

(iv). බෙම්ටො තාලයයි

08. දාදරා තාලය දෙගුණ වූ විට ගොඩ නැගෙන තාලය වනුයේ,

(i). ලාවනි තාලයයි (ii). බෙම්ටො තාලයයි (iii). ත්‍රිතාලයයි (iv). ජප් තාලයයි

09. බෙම්ටො තාලයට අනුව ප්‍රස්ථාර කළ ගී පාදය වනුයේ,

(i). රුවන් | නිදන | හෙලබි | මයි-|

(ii). සුවඳ | පත්ම | ඕලු | ආදි |

(iii). යමුණා- | යමුණා- | සෝබන | ගංගා |

(iv). රන්ම | ලක් ලෙස | දෙව්බ |

10. | දොං | ජිංත | ගත | දොංත | නිවැරදි පිළිතුර තෝරන්න.

(i). මෙය මැදුම් මහ දෙතිතයි

(ii). සුළු මැදුම් දෙතිතයි

(iii). සුළු මහ දෙතිතයි

(iv). මහ තනිතිතයි

11. කෙහෙරවා තාලයේ ආවර්ථ දෙකකදී ලැබෙන මාත්‍රා සංඛ්‍යාවට සමාන හින්දුස්ථානි තාලය වන්නේ,

(i). ත්‍රිතාලය (ii). දීප් චන්දි තාලය (iii). දාදරා තාලය (iv). ජප් තාලය

12. තාලයක අප්‍රාණික ආඝාතය කිනම් නමකින් හැඳින්වේද?

(i). සම ග්‍රහය (ii). විෂම ග්‍රහ (iii). ඛාලිස්ථානය (iv). අනුතාල

13. තබ්ලාව වාදනයේදී දැතම යොදා ගනිමින් උපදවනු ලබන අවනද්ධාක්ෂර දෙකක් වනුයේ,

(i). කත්, ත (ii). තින්, න (iii). ධින්, ධා (iv). තිට, න

14. කායදා, පල්ටා, පරන්, රේලා ආදී අවනද්ධ පද වැයීමට සුදුසු වාද්‍ය භාණ්ඩය වන්නේ,

(i). ගැටබෙරය (ii). තබ්ලාව (iii). දවුල (iv). මද්දලය

15. සංගීතයේ ත්‍රිවිධ ලය යනු,

(i). උච්ච, මන්ද්‍ර, මධ්‍ය වේ

(ii). විලම්භ, මධ්‍ය හා දෘත ලය

(iii). සුළු මැදුම් මහ තුන්තිත වේ

(iv). සමග්‍රහ හා අනුතාල වේ

16. තාලයක සමග්‍රහ හා ඛාලිස්ථානය හැරුණු විට ඇති තාලස්ථාන කුමන නමකින් හැඳින්වේද?

17. දේශීය අවනද්ධ භාණ්ඩ 5 ක් නම් කරන්න.

18. ''මල් සුවඳ මුසු වෙලා'' මෙම ගී පාදය විභාග වී ඇත්තේ කුමන තිතටද?

19. එම තිතට අදාළ බෙර පදය විභාග කර ලියන්න.

20. එම බෙර පදයට සමාන හින්දුස්ථානි තාලය විභාග කර ලියන්න.

21. මාත්‍රා 16 ක හින්දුස්ථානි තාලය විභාග කර දක්වන්න.

22. එම තාලයට ගැළපෙන ගී පාදයක් ප්‍රස්ථාර කර ලියන්න.

23. ඔබ උගත් ග්‍රහ වර්ග 3 නම් කරන්න.

24. එම ග්‍රහ වර්ග තුනට ගැයෙන ගී පාදයක් බැගින් ප්‍රස්ථාර කරන්න.

25. සමග්‍රහය හා ඛලිය අතර වෙනස පැහැදිලි කරන්න.

26. තබ්ලාවේ රූප සටහනක් ඇඳ පහත දැක්වෙන කොටස් නිවැරදිව නම් කරන්න.

(i). ෂියාහි (ii). චාන්ටි (iii). ගජරා (iv). ලවය (v). සට්ටා (vi). මෛදාන් (vii).දායාව, බායාව

27. (i). දේශීය තිත් ක්‍රමයට අනුව තනි තිතේ ප්‍රභේද නම් කරන්න.

(ii). දෙතිතේ ප්‍රභේද නම් කරන්න.

(iii). දෙතිතට අයත් ප්‍රභේද (තාල) ප්‍රස්ථාර කරන්න.

(iv). ඊට සමාන පෙරදිග තාල නම් කරන්න.

(v). හින්දුස්ථානි (පෙරදිග) තාල හා දේශීය තිත් අතර ඇති සම විෂමතා පැහැදිලි කරන්න.

28. පහත සඳහන් පාරිභාෂිත පද කෙටියෙන් පැහැදිලි කරන්න.

තාලය, මාත්‍රා, ආවර්ථ, අනුතාල, සමග්‍රහය, මද්දලය, තබ්ලාව

29. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | තාලයේ නම | හින්දුස්ථානි තාල පදය | දේශීය තිත |
|---|---|---|---|
| A | ජප් තාලය | | |
| B | ඡෙම්ටො තාලය | | |
| C | දීප් චන්දි තාලය | | |

30. තබ්ලාව පිළිබඳ හැඳින්වීමක් කරන්න. (එහි විකාශය හා වාදන ශිල්පීන් සමඟ)